සන්නස

# හද රිදවන මතක සුවඳ



12

හෝඩියේ පන්තියේදී ඇති වූ යාළුකමක් අවුරුදු 27 ක් තිස්සේ එනම් මට වයස අවුරුදු 32 ක් වනතුරුම පවත්වා ගෙන ආවානම් ඒ සරත් ජයනාත් නානායක්කාර පමණ ය. අප දෙදෙනා අකුරු කරන්නට ගියේ ගමේ මිනිසුන් කන්දෙවත්ත ඉස්කෝලය නමින් හැඳින්වූ හෝලික්‍රොස් හෙවත් ශුද්ධ වූ කුරුසියේ පාඨශාලාවට ය. පස්වැනි පන්තියේදී හෝලික්‍රොස් එකට ආයුබෝවන් කියූ මා මාතර සාන්ත තෝමස් විදුහලට ඇතුළත් වුණෙමි. එහෙත් අපගේ මිතුදම නොබිඳුනි. එක් හේතුවක් වූයේ සුරතලයට ඇති කරන මාළුන්ය. ඔහුත් මමත් දෙදෙනාම මේ මසුන් ඇති කළෙමු. ආරවුල් සිදු නොවුනාම නොවේ. ටික දිනකට තරහ වුවද අපි යළි මිතුරු වීමු.

1979 පමණ වනතුරුම සරත් හිටියේ ත්‍රිකුණාමලයේ ය. ඔහු රැකියාව කළේ ත්‍රිකුණාමලයේ කිංග්ස් හෝටලයේ අවන්හලේ බාර් කීපර් වශයෙනි. වසරකට දෙවතාවක් පමණ සතියක හෝ දෙකක නිවාඩුවකට ගමට එන ඔහු අතදිගහැර වියදම් කරන බවක් පෙනෙයි. හවසට මා හමුවන්නට එන ඔහු ඇඟ රත්වෙන යමක් පානය කර සිටින බව මට හැඟෙයි. කථාවට වඩා සිනාසෙන ඔහු දුම්වැටි උරමින් කට උල්කර දුම් වළලු පාකර හරියි.

ඇත්තෙන්ම මට ඔහුගේ සැබෑ නමින් ඔහු ඇමතුනේ නැති තරම්ය. පාසල් යන කාලයේ පටන්ම ඔහුට 'එවරෙඩි පූසා' යන අන්වර්ථ නමක් පටබැඳී තිබුණේ ය. එයට හේතු වී තිබුණේ ඔහුගේ මුහුණේ ස්වරූපය එවරෙඩි බැටරි කෑලිවල සිටි පූසාගේ රූපයට සමාන වී තිබීමලු. කෙසේ හෝ මේ නම ජනප්‍රියව තිබුණෙන් මිතුරන් අතර ඔහුගේ නියම නම යටපත්ව පටබැඳි නාමය ඉස්මතුව තිබිණ. පසුව එවරෙඩි කෑල්ල හැලී 'පූසා' යන්න පමණක් ඉතිරි විය. මිතුරන් මෙනමින් තමා ඇමතීම ඔහුට ද හුරුපුරුදුව ගිය බැවින් දෝ ඊට විරුද්ධයක් නොදැක්වී ය. මවිසින් ඔහු අමතන ලද්දේ ද 'පූස්' නමිනි.

එක් වතාවක් ගමට ආ පූසා මට පවසන ලද්දේ තමා ත්‍රිකුණාමලයේ දී ජ.වි.පෙ. සම්බන්ධ වූ බවත්, තමා රැකියාවෙන් ඉවත් වී පක්ෂයේ වැඩ කිරීමට බලාපොරොත්තු වන බවත්, එහෙත් තමා කැමති ත්‍රිකුණාමලයේ වැඩ කිරීමට නොව ගමේ වැඩ කිරීමට බවත් ය. මා ඔහුට උපදෙස් දුන්නේ රැකියාවෙන් ඉවත්වීමට හදිසි නොවී ත්‍රිකුණාමලයේ සිට පක්ෂයේ වැඩ කරන ලෙස ය.

එයින් මාස කිහිපයකට පසු පූසා ගමට ආවේ රැකියාවට ආයුබෝවන් කීමෙන් පසුව ය. තමා දැන් ත්‍රිකුණාමලයේ හැර දමා ආවත් දිනෙන් දින උග්‍රවන කොටි ත්‍රස්තවාදීන්ගේ තර්ජන හමුවේ නුදුරු දිනයකදීම සිංහලයන්ට ත්‍රිකුණාමලය හැරදාමා යාමට සිදුවන බවද ඔහු පැවසී ය. වැඩි කලක් නොයා ඔහුගේ කියමන සත්‍ය විය. ත්‍රිකුණාමලයේ වසර ගණන් පදිංචිව විශාල ව්‍යාපාර කළ සිංහලයෝ කොටි ප්‍රහාරයන්ට ලක්ව සියලු දේපළ විනාශව හැඳිවත් පිටින් දකුණට ආහ.

එයින් මාස කිහිපයකට පසු පූසා ගමට ආවේ රැකියාවට ආයුබෝවන් කීමෙන් පසුව ය. තමා දැන් ත්‍රිකුණාමලයේ හැර දමා ආවත් දිනෙන් දින උග්‍රවන කොටි ත්‍රස්තවාදීන්ගේ තර්ජන හමුවේ නුදුරු දිනයකදීම සිංහලයන්ට ත්‍රිකුණාමලය හැරදාමා යාමට සිදුවන බවද ඔහු පැවසී ය. වැඩි කලක් නොයා ඔහුගේ කියමන සත්‍ය විය. ත්‍රිකුණාමලයේ වසර ගණන් පදිංචිව විශාල ව්‍යාපාර කළ සිංහලයෝ කොටි ප්‍රහාරයන්ට ලක්ව සියලු දේපළ විනාශව හැඳිවත් පිටින් දකුණට ආහ.

මම පූසා පක්ෂයට සම්බන්ධ කළෙමි. ඔහු හිතවතෙකුගේ මට්ටමින් වැඩ කටයුතු කළේ ය. එහි අර්ථ කාලීන සාමාජිකයෙකු හෝ පූර්ණ කාලීන සාමාජිකයෙකු ලෙස කමිටුවක් නියෝජනය නොකළ බවයි.

නිදහස් අධ්‍යාපනය කප්පාදු කිරීම සඳහා යූ.ඇන්.පී. රජය විසින් ගෙන ආ අධ්‍යාපන ධවල පත්‍රිකාවට රටපුරාම වූ සිසුපරපුරෙන් බලවත් විරෝධයක් නැගිණ. සමාජවාදී ශිෂ්‍ය සංගමය ඊට නායකත්වය සැපයී ය. ශ්‍රී සුමංගල බාලිකාව හැර වැලිගම ප්‍රදේශයේ සියපුම පාසල් වර්ජනයට එක්වූහ. ලාල් නැමැති සහෝදරයා සමඟ බාලිකාවේ ගේට්ටුව අසලට ගිය මම වර්ජනයට එක්වන්නැයි බාලිකාවන්ගෙන් ඉල්ලා සිටියෙමි. මගේ නැගණිය ද එහි සිසුවියක බැවින් බාලිකාවේ බොහෝ දෙනෙකු මා දත්හ. ලාල් සහෝදරයාගේ බිරිඳ ද ගුරුවරියකි. මිනිත්තු දහයක් පමණවත් ගත නොවී ය. සිසුවියන් රෑන් පිටින් පංතිවලින් පිටතට ආහ.

ශ්‍රී සුමංගල බාලිකාව පිහිටියේ මොන්ටේගු ජයවික්‍රම රාජ්‍ය පරිපාලන ඇමතිවරයාගේ පෞද්ගලික නිවස (මොන්ටි වලව්ව) ළඟමය. එහි විදුහල්පතිනිය වූයේ ඇමතිවරයා පත්කළ තැනැත්තියකි. තමාගේ අත ළඟම වූ බාලිකා විදුහල වර්ජනයට එක්වීම ඇමතිවරයා ලජ්ජාවට පත්කිරීමට හා කුපිත කිරීමට හේතු වූවකි.

ලාල් සහෝදරයාත් මමත් අප නිවසට පැමිණ ආලින්දයේ වූ පුටු දෙකකට බරව සුමංගලය වර්ජනයට ගැනීමේ තෘප්තිය විඳිමින් සිටියෙමු.

පූසා පැමිණියේ මෙම මොහොතේදී ය. අපගේ නැන්දනියකගේ වත්තේ වූ පොකුණක් වැනි ළිඳකට නෑම සඳහා යාමට ඔහුත් මමත් පුරුදුව සිටියෙමු. සරම හා සබන් පට්ටය තුවායේ ඔතාගෙන පූසා ආවේ නාන්නට යන්න ය.

පූසා ගෙට ගොඩවී මිනිත්තුවක් යන්නටත් ප්‍රථම අපගේ නිවස ඉදිරිපිටම නවත්වන ලද කාරයකින් බැස්සේ ඇමති වලව්වේ නිතර ගැවසෙන පුද්ගලයෙකු හා පොලිස් භටයන් තිදෙනෙකි. පඩි දෙකතුන නැග ඉස්තෝප්පුවට ගොඩ වූ ඇමති ගෝලයා, "සර්, මේ රෝහිත, මේ බකට් ලාල්, මේ සරත්" කියා අප තිදෙනා හඳුන්වා දුන්නේ ය. ඒ සමඟම ආලින්දයට ගොඩවූයේ උසස් පොලිස් නිලධාරියෙකි.

"මම මාතර ඒ.එස්.පී. පොලිසියට යන්න සූදානම් වෙන්න." ඔහු මට පැවසී ය.

"මොකක්ද අපි කළ වරද ?" මම විමසීමි.

"ඉස්කෝලෙ පංති වර්ජනයට පෙළඹවීම. පී.සී. මෙයාලට හෑන්ඩ් කප් දාලා පොලිස් ස්ටේෂන් එකට අරගෙන එන්න."

පොලිස් භටයන් තිදෙනාට පැවසූ ඔහු පොලිස් කාරයට නැගීමට සූදානම් විය.

"සර් - අපිට මාංචු දාලා හැතැප්මක් විතර දුර තියෙන පොලිසියට පයින් අරන් යන්න අපි අපරාධකාරයෝ නෙවී. අපිට පයින් යන්න බෑ. වාහනේකින් ගෙනි යන්න."

මොහොතක් මා දෙස බලා සිටි උප පොලිස් අධිකාරී 'සිරිසේන හේරත්' මහතා (අද නියෝජ්‍ය පොලිස්පතිවරයෙකි) එක් කොස්තාපල් වරයෙකු සමඟ අප තිදෙනා මෝටර් රථයේ පිටුපස අසුනට නංවා ඉතිරි කොස්තාපල් වරුන් දෙදෙනොටත්, ඇමති ගෝලයාටත් පයින් හෝ වෙනත් වාහනයක නැගී පොලිසියට එන්නැයි පවසා අප වැලිගම පොලිසිය වෙත රැගෙන ගියේ ය. පසුව උසාවියට ඉදිරිපත් කරන ලද අපි සති දෙකකට රක්ෂිත බන්ධනාගාර ගත කෙරිණ. මා සමග නෑම සඳහා යන්නට ආ පූසාට සිදු වූයේ සති දෙකක් රිමාන්ඩ් බන්ධනාගාරයේ තපින්නට ය.

1982 ජනපති ඡන්දයට මාස හත අටක් තිබියදීම අප මැතිවරණ සමිති පිහිටුවීමටත් ගෙන් ගෙට යාමටත් පටන් ගතිමු. එවන් කැන්වසින් ව්‍යාපාරයක් හමාර කළ අපි දහදෙනෙකු පමණ නගරයේ සිට අප නිවස බලා පා ගමනින්ම යන්නට වූයෙමු. මගේ පොඩි මල්ලී වූ දයා ද අප සමඟ විය. ඔහු අයාලේ යන බලු පැටවකු "ඉංජු කු කු" කියමින් අප සමඟ කැඳවාගෙන යමින් උන්නේ ය. අප එම අවස්ථාවේ යමින් සිටියේ ඇමති වළව්ව ඉදිරිපිටිනි. අප පසුකර බයිසිකලයෙන් ගිය අඳුනන අයෙකු "ආ මේ බලු කුක්කෙකුත් හොයාගෙන තියෙන්නේ"යයි නිකමට මෙන් කියාගෙන ගියේ ය.

"ඔව් ඔව් මේ ඇමතිගෙ බල්ලනේ" පූසා වහාම උත්තර දුන්නේ ය.

අප සියලු දෙනාම අපගේ නිවසට පැමිණෙත්ම වාගේ ඇමති ගෝලයා සහ තවත් දෙදෙනෙකු පැමිණියහ.

"පූස් සරත් මට ඇමතිගෙ බල්ලයි කිව්වා. ඌ එළියට දෙන්න" ඇමති ගෝලයා ඉල්ලීය.

"ඒක කිව්වේ අපිත් එක්ක ආ බලු පැටියට. ඔහේ මොකටද භාරගත්තෙ ?" මම විමසීමි.

"අපිට ඔහෙත් එක්ක ප්‍රශ්නයක් නෑ. ඒ උනාට පූස් සරත්ට ගහන්නට ඕන"

බහින්බස්වීම දුරදිග යද්දී පූසා අපගේ නිවසේ පිටුපස පැත්තෙන් පිට කරන්නැයි මම සගයෙකුට කීමි. සංග්‍රාමය ඇරඹිණ. ඇමති ගෝලයාගෙ සහායටද පිරිස් ආහ. මහ මාවත එකම යුධ පිටියක් බවට පත් විය. තුවාල ලද්දෝ දෙපසෙහිම වූහ. ඇමති ගෝලයාගේ පිරිස පසුබැස ගියපසු දැන් පොලිසියෙන් පැමිණිය හැකි බැවින් සියලු දෙනාම වහාම විසර යන්නැයි මම ඉල්ලා සිටියෙමි.

මේ දැන් යුද්ධයක් අවසන් වූ සංග්‍රාම භූමියක් සේ දිස් වූ මහා මාවත පුරා ඇති පොලු, මුගුරු, ගල්, මුල්, බිඳී ගිය බෝතල්වල වීදුරු කටු ආදී දේ දෙස බලමින් සිදුවූයේ කුමක්දැයි මා සිතන කල සයිරන් නළා හඬවා ගෙන දිවඑන පොලිස් ජීප්රථවල හඬ ඇසෙන්නට විය.

"දුවන්න දුවන්න අයියෝ දුවන්න" සුගුණා, චන්ද්‍රා යන නැන්දලා දෙදෙනො මා ගෙතුලට තල්ලු කරමින් බියෙන් කෑ ගැසූහ. නිවසේ පිටුපසට දිවගිය මා අප නිවස පිටුපස වත්ත වූ හබරාදු-ගේ වත්තට පැන එහි වූ කන්දට තිත්ත කරුවලේම දුව ගියෙමි.

මෙම කන්දේ නාගයන් සිටින බව මම අසා තිබුණේ බාල කල සිටය. බැදි අකුල් පීරාගෙන කන්දේ මඳක් ඉහළට ගිය මා පොල්මුලක් මතට ගොඩවී අපේ ගෙදර ඇත්තන්ට තර්ජනාත්මක හඬින් යම් යම් දේ කියන පොලිස්කාරයන්-ගේ හඬට කන්යොමා උනිමි. එවිටම මගේ පිටුපසින් ඇසුණේ 'සරස්' යන හඬකි. එය නාගයෙකුගේ හෝ පිඹුරු තඩියෙකුගේ හඬ විය නොහැකිද ? එහෙත් තිත්ත කලුවරේ මට මිනිසු රුවක ඡායාවකි. "කව්ද ?" මා විමසුවේ සෙමින් වුව තර්ජනාත්මකව ය. "මේ මම" ඒ පූසාගේ කටහඬ ය.

හිතවතාගේ කීම අනුව ගමෙන් පිටවී යනහැටි මම සැළසුම් කළෙමි.

*ලබන කලාපයට*

රෝහිත මුණසිංහ
*ප්‍රංශයේ සිට*